# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 7 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 පෙබරවාරි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 පෙබරවාරි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 10.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2004 අංක 7 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 පෙබරවාරි මස 06 වන දින]

එල් ඩී.— ඕ.59/2002.

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මෙම පනත 2004 අංක 7 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනතේ පූර්විකාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අතර, පහත සඳහන් පූර්විකාව ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරන පනතේ පූර්විකාව සංශෝධනය කිරීම.

> "පුස්තකාල ප්‍රලේඛනගත කිරීම සහ තොරතුරු සේවා සහ අදාළ විෂයයන් අධ්‍යයනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, වැඩි දියුණු කිරීම සඳහා ද, පුස්තකාල විද්‍යාව, ප්‍රලේඛනගත කිරීම සහ තොරතුරු විද්‍යාව අධ්‍යයනය කිරීම සහ ඉගැන්වීම සංවිධානය කිරීමට, සංවර්ධනය කිරීමට සහ පාලනය කිරීම සඳහා ද පුස්තකාලයාධිපතිත්වය සහ තොරතුරු විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි තත්ත්වය, ඓතිහාසිකම් හා සුභසාධනය පෝෂණය කර පවත්වාගෙන යාම සඳහා ද, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී සංගමයට අදාළ සියලු කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා ද "ශ්‍රී ලංකා පුස්තකාල සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් ශ්‍රී ලංකාවෙහි මෙතෙක් පිහිටුවා තිබූ හෙයින් ද :
>
> එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීම යෝග්‍යවන හෙයින් ද :"

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2—H 10741– 4,500 (2004/02)

"සංස්ථාවේ සාමාජිකත්වය.

3. (1) (අ) සංස්ථාවේ සාමාජිකත්වය සංස්ථාගත සාමාජිකයන්ගෙන් සහ සංස්ථාගත නොවන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(ආ) සංස්ථාගත සාමාජිකයන් සම්මාන සාමාජිකයන්ගෙන් සහ ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, ඔවුන්ට ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය තිබිය යුතු ය.

(ඇ) සංස්ථාගත නොවන සාමාජිකයන්ට (සංස්ථාගත සාමාජිකයන් වීමට සුදුසුකම් නැති තැනැත්තන්) ඡන්දය දීමේ අයිතිවාසිකම නොතිබිය යුතු ය.

(2) සභාව විසින් —

(අ) සංගමයේ සාමාජිකත්වය සඳහා වූ සුදුසුකම් හා නුසුදුසුකම් ;

(ආ) සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම්පත්‍රයේ ආකෘති පත්‍රය ;

(ඇ) ඉල්ලුම්පත්‍ර ගාස්තුව ;

(ඈ) සාමාජිකත්වය පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා වූ ආකෘති පත්‍ර සහ කොන්දේසි ;

(ඉ) සාමාජිකයන්ගේ නාමලේඛනය පවත්වාගෙන යාමේ ආකාරය ;

(ඊ) සාමාජික ගාස්තුවට අමතරව ගාස්තුවක් ගෙවීම, සාමාජික ගාස්තුව ගෙවීමෙන් අත්හැරීම හෝ අඩුකිරීම ;

(උ) සාමාජික ගාස්තුව නොගෙවීමේ ප්‍රතිඵලය ;

(ඌ) සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද සහ කාර්යයන් ද සාමාජිකත්වය පිළිබඳ කොන්දේසි ද,

රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කවර හෝ වර්ගයකට අයත් වූ සංස්ථාවේ සාමාජිකයන් වන සියලු තැනැත්තන් සියලු කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට එම වර්ගයටම අයත් සංස්ථාවේ සාමාජිකයන් ලෙස තව දුරටත් ක්‍රියා කළ යුත්තේ ය.'' .

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අතර, ඊ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සංස්ථාවේ පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ පුස්තකාල ප්‍රලේඛනගත කිරීම සහ තොරතුරු සේවා පිහිටුවීම, පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ එම සේවා සඳහා වෘත්තිය ප්‍රමිතින් ඇති කිරීම ;

(ආ) පුස්තකාල ප්‍රලේඛනගත කිරීම සහ තොරතුරු සේවා පිළිබඳ සියලු අංශයන් සැලසුම් කිරීමට, වැඩ පිළිවෙළ යකස් කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ සියලු බලධරයන් සමග සම්බන්ධීකරණය කිරීම සහ ඒවාට සහයෝගය දීම ;

(ඇ) පුස්තකාල විද්‍යාව, ප්‍රලේඛනගත කිරීම සහ තොරතුරු සේවා යන ක්ෂේත්‍රවල නව තාක්ෂණය භාවිත කිරීමෙහි ලා වෘත්තිමය උපදෙස් දීම, ප්‍රවර්ධනය, පහසුකම් සැලසීම සහ ආධාර කිරීම ;

(ඈ) පුස්තකාල විද්‍යාව, ප්‍රලේඛනගත කිරීම සහ තොරතුරු සේවාවලට අදාළව සාකච්ඡා, රැස්වීම් සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සහ ඊට උනන්දුවක් දක්වන තැනැත්තන් සහභාගි කරවා ගැනීම සඳහා දිරි දීම සහ පහසුකම් සැලසීම ;

(ඉ) පුස්තකාලයාධිපතීන්ගේ සහ තොරතුරු විද්‍යාඥයන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද, සේවා තත්වය, සම්බන්ධතා සහ සුභසාධනය ආරක්ෂා කිරීම, සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) වෘත්තියමය, පුස්තකාලයාධිපතීන් සහ තොරතුරු විද්‍යාඥයන් වශයෙන් සුදුසුකම් ලැබීමට අපේක්ෂිත තැනැත්තන්ගේ අධ්‍යාපනය සහ පුහුණුව සංවිධානය කිරීම, පවත්වාගෙන යාම සහ පාලනය කිරීම සහ ඒ කාර්ය සඳහා උචිත අධ්‍යයන පාඨමාලා නියම කිරීම, අනුමත කිරීම සහ ප්‍රතිතනය කිරීම ;

(උ) පුස්තකාල විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය සහ සේවා අධ්‍යයනය කිරීම, ඉගැන්වීම සහ ඒවා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැලසීම ;

(ඌ) සංගමයට සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය ආයතන සහ සංගම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධීකරණය ;

(එ) පුස්තකාල සහ තොරතුරු සේවාවල නියැලී සිටින සියලු තැනැත්තන් එකමුතු කිරීම සහ ඔවුන් අතර සම්බන්ධීකරණය සහ සහයෝගය ප්‍රවර්ධනය කිරීම ;

(ඒ) ශ්‍රී ලංකාව තුළ පිහිටි පුස්තකාල අතර සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) පුස්තකාල තොරතුරු සහ ප්‍රලේඛනගත කිරීමේ විද්‍යාව පිළිබඳ ලිපි ලේඛන එකතු කිරීම සහ පුස්තකාල සහ ප්‍රලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම ;

(ඕ) සංගමයේ සාමාජිකයන් සඳහා චාර්තා හා ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම සහ එකී චර්යා සහ ආචාර ධර්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම ; සහ

(ක) ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික වන හෝ උපකාරී වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ප්‍රත්‍යාදිෂ්ට කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) සංස්ථාවේ මහා සභා රැස්වීමේ දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී සංස්ථාවේ රීතිවලට අනුකූලව එහි සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගත යුතු පහත නිශ්චිතව දක්වා ඇති සංස්ථාවේ ධුර දරන්නන් :—

(i) සභාපති ;

(ii) සභාපති-තෝරා පත්කර ගත් ;

(iii) උප සභාපති ;

(iv) මහලේකම් ;

(v) සහකාර මහලේකම් ;

(vi) භාණ්ඩාගාරික ;

(vii) අධ්‍යාපන නිලධාරි ;

(viii) සහකාර අධ්‍යාපන නිලධාරි ;

(ix) ප්‍රකාශන නිලධාරි ;

(x) තොරතුරු සහ මහජන සම්බන්ධතා නිලධාරි ;

(ආ) සභාවේ පළින් සිටි සභාපතිවරයා.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන අයුරින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ප්‍රත්‍යාදිෂ්ට කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) අවශ්‍ය යයි සභාව සලකන විනය කමිටු, ස්ථාවර කමිටු, හා වෙනත් කමිටු සංස්ථාපනය කිරීම ;

(ආ) පවත්නා රීතිවලට සහ නියෝගවලට ද චර්යා සහ ආධාර ධර්ම පිළිබඳ සංග්‍රහයට ද, එකතු කිරීම්, ඒවා වෙනස් කිරීම්, සංශෝධනය කිරීම් සම්බන්ධයෙන් සංස්ථාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම:";

(2) ඒ උපවගන්තියේ (ඪ), (ඬ), (ඹ), (ඳ), ඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඪ) ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් විශිෂ්ටත්වය පිළිබඳ ප්‍රදානයන් ප්‍රදානය කිරීම සහ ඒ කාර්ය සඳහා විශේෂ අරමුදලක් පිහිටුවීම ;

(ඬ) වෙනත් ආයතන විසින් පවත්වනු ලබන පුස්තකාල සහ තොරතුරු විද්‍යා පාඨමාලා පිළිගැනීම සහ ප්‍රතිතනය කිරීම සම්බන්ධයෙන් ද පුස්තකාලයාධිපතිත්වය සහ තොරතුරු විද්‍යාව පිළිබඳ වෘත්තියට අදාළව වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් ද උපදෙස් දීම ;

(ඹ) පුස්තකාල විද්‍යාව ප්‍රලේඛනගත කිරීම සහ තොරතුරු සේවා පිළිබඳ දූරස්ථ අධ්‍යාපන පාඨමාලා පිළියෙල කරන තැනැත්තන්ට, විභාග පරීක්ෂකවරුන්ට, කථිකාචාර්යවරුන්ට සංගමය විසින් ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම ;

(ඳ) සංගමයේ ධූර දරන්නන්ගේ ඇයිතිවාසිකම්, බලතල, කර්තව්‍ය සහ වරප්‍රසාද තීරණය කිරීම ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රත්‍යාදිෂ්ට කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අ) මෙහි පහත නිශ්චිතව දැක්වෙන නිලධරයන් :—

(i) සභාපතිවරයා ;

(ii) තෝරා පත්කර ගත් සභාපතිවරයා ;

(iii) උපසභාපතිවරයා ;

(iv) මහ ලේකම්වරයා ;

(v) සහකාර මහ ලේකම්වරයා ;

(vi) භාණ්ඩාගාරික ;

(vii) අධ්‍යාපන නිලධරයා ;

(viii) සහකාර අධ්‍යාපන නිලධරයා ;

(ix) ප්‍රකාශන නිලධරයා ;

(x) තොරතුරු හා මහජන සම්බන්ධතා නිලධරයා,"

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඕ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඕ) සංස්ථාවේ සම්මාන සාමාජිකත්වය සහ ආශ්‍රිත සමාජිකත්වය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම ;"

(2) ඒ උපවගන්තියේ (ක) ඡේදය, (බ) ඡේදය වශයෙන් නැවත අංක යෙදීම ; සහ

(3) ඒ උපවගන්තියේ (ඕ) වන ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ක) ශිෂ්‍යත්ව, පදක්කම් සහ විශිෂ්ටත්වය පිළිබඳ වෙනත් ප්‍රධාන ප්‍රදානය කිරීමට අදාළව සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ; සහ"

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එම ප්‍රඥප්තියේ 17 වන වගන්තිය වශයෙන් නැවත අංක යෙදීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12, 13, 14, 15, 16, වන වගන්ති ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 12, 13, 14, 15, 16 වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :—

"සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම් හා විනය, බලතල සහ කාර්ය පටිපාටිය.

12. (1) යම් තැනැත්තකු —

(අ) සිහිවිකල් පුද්ගලයකු බවට ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබුවහොත් ඔහු :

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින්, බුන්වත්භාවයට පත් තැනැත්තකු හෝ බංකොලොත්භාවයට පත් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඔහු බුන්වත්භාවයට හෝ බංකොලොත් භාවයට පත් වූයේ නොවැළැක්විය හැකි පාඩු, අවාසනාවන්ත සිද්ධි නිසා වූ බවට වන සහතිකයක් එම අධිකරණ විසින් ප්‍රදානය කරනු නොලැබ ඇත්නම් ඔහු ද ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් චරිත දූෂණාත්මක වූ ද බරපතල වැඩ ඇතිව මාස තුනකට වැඩි කාලයකින් දඬුවම් කළ හැකිවන්නා වූ ද යම් වරදක් හෝ යම් නිශ්චිතව දක්වා ඇති වරදක් සඳහා ඔහු වරදකරු කර ඇත්නම්,

එම තැනැත්තා සංගමයේ සංස්ථාගත සාමාජිකයකු ලෙස ඇතුළත් කර නොගත යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති තුසුදුසුකම්වලින් යම් නුසුදුසුකමකට පත්වන යම් සංස්ථාගත සාමාජිකයකු සභාව විසින් සාමාජිකත්වයෙන් නෙරපනු ලැබිය යුතු ය. එසේ වුවද එම නුසුදුසුභාවයට එම තැනැත්තා යටත්වීම ඇවසන් වූ විට සභාව විසින් ස්වකීය අභිමතය පරිදි ඒ තැනැත්තා සාමාජිකයකු ලෙස නැවත ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

(3) සභාවේ මතය අනුව වෘත්තීමය විෂමාචාරයකට වරදකරු වී ඇති යම් සංස්ථාගත සාමාජිකයකු සභාව විසින් සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. "වෘත්තිමය විෂමාචාරය" යන්නෙන් තත්කාලයේ බලපවත්නා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෘත්තිමය පැවැත්ම හා ආචාර ධර්ම පිළිබඳ සංග්‍රහය උල්ලංඝනය කරන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදහස් වේ ;

එසේ වුවද අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු සභාව විසින්, සාධාරණ සහ යුක්ති සහගත යයි සලකනු ලබන ආකාරයට ඒ සාමාජිකයා සාමාජිකත්වයෙන් නෙරපීම වෙනුවට ඔහුට තදින් අවවාද කිරීම හෝ ඔහුගේ සාමාජිකත්වය අවුරුද්දකට වැඩි නොවන කාලයකට අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

(4) ඒ සාමාජිකයා ඉහත සඳහන් නුසුදුසුකම්වලින් එක් නුසුදුසුකමකට හෝ යටත් වන බව නැතහොත් වෘත්තිය විෂමාචාරයට ඔහු වරදකරු වී ඇති බව සභාව විසින් පත් කරනු ලැබූ විනය කමිටුවක් විසින් පරීක්ෂණයකින් පසුව තීරණය කරනු ලැබ ඇත්නම් මිස සභාව විසින් මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන යටතේ යම් සංස්ථාගත සාමාජිකයකු සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, ඔහුගේ සාමාජිකත්වය අත්හිටුවීම හෝ ඔහුට තරයේ අවවාද කිරීම නොකළ යුතු ය.

(5) යම් සාමාජිකයකුගේ සාක්ෂි හෝ යම් තැනැත්තකුට හෝ සංවිධානයකට අදාළව යම් ලේඛනයක් යම් සාමාජිකයකු විසින් ඉදිරිපත් කිරීම ඉහත කී පරීක්ෂණය සඳහා අදාළ වන්නේ ය. නැතහොත් අවශ්‍ය වන්නේ ය, යන්න සභාව

විසින් පත් කරනු ලැබූ විනය කමිටුවේ මතය වන අවස්ථාවක, ඒ විනය කමිටුව විසින් ඒ තැනැත්තා වෙත දැන්වීමක් යවමින් සාක්ෂි දීම සඳහා හෝ එම ලේඛනය ඉදිරිපත් කිරීම සඳහා ඒ දැන්වීමෙහි නිශ්චිතව දැක්වෙන වේලාවේ දී සහ ස්ථානයේ දී පෙනී සිටින ලෙස නියම කිරීමට විනය කමිටුවට බලය ඇත්තේ ය.

(6) විනය කමිටුව විසින් තීරණයක් ගනු ලැබ ඇත්තේ යම් සංස්ථාගත සාමාජිකයකු සම්බන්ධයෙන් ද, ඒ සාමාජිකයා විසින් ඒ තීරණයට එරෙහිව සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

විගණනය සහ ගිණුම්.

13. (1) සංස්ථාවේ ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද වෙනත් සියලු ගණු දෙනු සම්බන්ධයෙන් ද නිසි පරිදි පොත් සහ ගිණුම් පවත්වා ගෙන යාමට සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන් ලෙස වෘත්තියේ යෙදීමට පුදුසුකම් ලබා ඇති තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් විගණනය කිරීමට යටත් විය යුතු අතර, ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී එම කාර්ය සඳහා පත් කරනු ලැබිය යුතු ය.

විරුද නාමය භාවිත කිරීම.

14. (1) සංගමයේ ක්‍රියාශීලී සෑම සංස්ථාගත සාමාජිකයකුට ම "වරලත් පුස්තකාලයාධිපති" යන අභිධානය ගැනීමට හා භාවිච්චි කිරීමට හිමිකම ඇත්තේ ය. අධි සාමාජිකයකුට ස්වකීය නමට පසුව, "එෆ්. එල්. ඒ. (ශ්‍රී ලංකා)" යන මුලකුරු ද ආශ්‍රිත සාමාජිකයකුට "ඒ. එල්. ඒ. (ශ්‍රී ලංකා)" යන මුලකුරු ද භාවිච්චි කිරීමට හිමිකම ඇත්තේ ය.

(2) ඉහත කී ලෙස හැර, යම් තැනැත්තකු විසින් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් "වරලත් පුස්තකාලයාධිපති" යන අභිධානය හෝ "එෆ්. එල්. ඒ. (ශ්‍රී ලංකා)", "ඒ. එල්. ඒ. (ශ්‍රී ලංකා)" යන මුලකුරු ගැනීම හෝ භාවිච්චි කිරීම ද නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

දණ්ඩන.

15. (1) මේ පනත යටතේ යම් වරදකට වරදකරු වන යම් තැනැත්තෙක් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

පොදු මුද්‍රාව.

16. (1) සංගමයේ මුද්‍රාව සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලැබිය හැකි ස්වරූපයෙන්, ප්‍රමාණයෙන් සහ හැඩයෙන් යුක්ත විය යුතු ය.

(2) ඒ මුද්‍රාව සුරක්ෂිත ලෙස තබා ගැනීම සඳහා සභාව වගකිව යුතු ය. සභාව විසින් යෝජනා සම්මතයක් මගින් කලින් කල බලය පවරනු ලැබිය හැකි සභාවේ නිලධරයන් දෙදෙනකු ඉදිරිපිට දී සභාවේ මුද්‍රාව ඔප්පුවලට සහ ලේඛනවලට තැබිය යුතු අතර තමන් ඉදිරිපිට දී එම මුද්‍රාව තැබූ බවට සාක්ෂියක් වශයෙන් එම නිලධරයන් දෙදෙනා සහතික කළ යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.